# රුහුණ විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරු සඳහා 2018.05.25 දින තෙක් මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

**01. <u>වැඩ පරිපාලක (සිවිල්) III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය (සිවිල්) හෝ සමාන සුදුසුකමක් සහිත තෙවර්ෂයක පළපුරුද්ද. තාක්ෂණය පිළිබඳව ජාතික සහතික පාඨමාලාව හදාරමින් අදාල පළපුරුද්ද ලබාගත හැකිය.

හෝ

රාජ්‍ය/රාජ්‍ය සංස්ථා හෝ පිළිගත් ඉංජිනේරු ආයතනයක යටත් පිරිසෙයින් වසර 05 ක වැඩ පරිපාලක (සිවිල්) තනතුරේ පළපුරුද්දක් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත් වී තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2018 වර්ෂය සඳහා රු.25,589 - 7×242; 10×287 - 30,153.00 [U MT 1(IIIA) ] වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**02. <u>පොත් තබන්නා (II ශ්‍රේණිය 'ආ' ඛණ්ඩය)</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය හා අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ ගණිතය ඇතුළුව විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

සහ

ii. (අ) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති බහු තාක්ෂණික ආයතනයකින්/කාර්මික විද්‍යාලයකින් පිරිනමා ඇති ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය ලබා තිබීම.

හෝ

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයේදී වාණිජ්‍ය හා මූල්‍ය ඇතුළුව විෂයයන් 03 කින් එකවර සමත් වීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.30,725 - 17×300 - 35,825.00 [ U MN 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2018 වර්ෂය සඳහා රු.24,863 - 17×242 - 28,977.00 වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට

අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 03. ශ්‍රව්‍ය දෘෂ්‍ය කාර්මික නිලධාරී (II ශ්‍රේණිය)

**අවශ්‍යා සුදුසුකම්:**

i. (අ) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික ආධුනිකත්ව මණ්ඩලය විසින් 1975 වසරේ සිට පිරිනමන ලද විශේෂ ඉංජිනේරු ආධුනිකත්ව සහතිකය හෝ 1989 වසරේ සිට පිරිනමන ලද ඉංජිනේරු තාක්ෂණිකයින් සඳහා වන ජාතික ඩිප්ලෝමාව හෝ තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව හෝ ඉලෙක්ට්‍රොනික හෝ බලශක්ති ක්ෂේත්‍රය සඳහා "සිටි ඇන්ඩ් ගිල්ඩ්ස්" ආයතනය විසින් පිරිනමා ඇති අවසාන සහතිකය සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය කටයුතු පිළිබඳ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම.

**හෝ**

(ආ) බහු තාක්ෂණික ආයතනයකින් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයකින් පිරිනමා ඇති අධ්‍යාපන තාක්ෂණවේදී ඩිප්ලෝමාව හෝ ශ්‍රව්‍ය දෘෂ්‍ය ශිල්ප ක්‍රමය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය කටයුතු පිළිබඳ එක් වසරක පළපුරුද්ද ලබා තිබීම (ඉහත ඩිප්ලෝමා පාඨමාලාවන් වසර දෙකක කාලයකට නොඅඩු විය යුතුය.)

හෝ

(ඇ) අ.පො.ස. (උ.පෙළ) විද්‍යා විෂයයන් 03 ක් සමත් වීම සහ වසර 06 ක ශ්‍රව්‍ය දෘෂ්‍ය කටයුතු පිළිබඳ පළපුරුද්ද ලබා තිබීම

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.42,590 - 20×615; 1×615 - 55,505/= (මාසික) U-MN 4(II) මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2018 වර්ෂය සඳහා රු.34,450 - 20×497; 1×555 - 44,945/= (මාසික) U-MN 4(II) වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 04. මහජන සෞඛ්‍ය පරීක්ෂක (III ශ්‍රේණිය) තනතුර

**අවශ්‍යා සුදුසුකම්:**

i. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ විභාගය සමත් වීම හා එම සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙකු වශයෙන් අවුරුදු 03 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2018 වර්ෂය සඳහා රු.25,589 - 7×242; 10×287 - 30,153.00 [U MT 1(IIIA) ] වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 05. හෙද නිලධාරී (II ශ්‍රේණිය) තනතුර (කාන්තා)

**අවශ්‍යා සුදුසුකම්:**

i. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 03 කට සම්මාන සාමාර්ථය සහිතව විෂයයන් 06 කින් සමත් වීම.

ii. ශ්‍රී ලංකා වෛද්‍ය මණ්ඩලය මගින් පිළිගනු ලබන හෙදි යෝග්‍යතා සහතිකයක් තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2018 වර්ෂය සඳහා රු.25,589 - 7×242; 10×287 - 30,153.00 [U MT 1(IIIA) ] වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**06.** **<u>සැළසුම් ශිල්පී (පහළ ශ්‍රේණිය) තනතුර</u>**

**අවශ්‍ය සුදුසුකම්:**

i. රජයේ දෙපාර්තමේන්තුවකින් හෝ පිළිගත් ආයතනයකින් පවත්වන ලද සැළසුම් ශිල්පය පිළිබඳ විභාගය සමත් වී තිබීම.

**වයස:** අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (එසේ වුවත් රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවකයින් සඳහා මෙම වයස් සීමාව බල නොපැවැත්වේ.)

**වැටුප් ක්‍රමය:** 2016.12.05 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020.01.01 දින සිට රු.31,625 - 7×300; 10×355 - 37,275.00 [U MT 1(IIIA) ] මාසික වැටුප් පරිමාණය හිමි වේ. එතෙක් 2018 වර්ෂය සඳහා රු.25,589 - 7×242; 10×287 - 30,153.00 [U MT 1(IIIA) ] වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ.

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**අනෙකුත් ප්‍රතිලාභ:**

විශ්වවිද්‍යාල සේවකයින් සිය මාසික වැටුපෙන් 10% කින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සඳහා දායක විය යුතු වේ. විශ්වවිද්‍යාලය ද පෙරලා වැටුපෙන් 15% කට (8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප සඳහා ද, 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට ද බැර කෙරේ.) සමාන මුදලක් දායක කරන අතර, තවත් 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා බැර කෙරේ.

අයදුම්කරුගේ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ සෙ.මී. 22×10 ප්‍රමාණයේ ලියුම් කවරයක් මාතර, වැල්ලමඩම, රුහුණ විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන) වෙත එවීමෙන් හෝ ආයතන අනධ්‍යයන අංශයට පැමිණ හෝ රුහුණ විශ්වවිද්‍යාලයේ වෙබ් පිටුවට පිවිස (www.ruh.ac.lk) නියමිත ආකෘති පත්‍ර ලබාගත හැකිය. 2018.05.18 දින තෙක් පමණක් අයදුම්පත් නිකුත් කරනු ලැබේ.

නියමිත ආකෘති පත්‍රයේ සම්පූර්ණ කරන ලද අයදුම්පත් "ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ආයතන අනධ්‍යයන), රුහුණ විශ්වවිද්‍යාලය, වැල්ලමඩම, මාතර." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ වම්පස ඉහළ කෙලවරේ සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම හා නියමිත දිනට පසුව එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. එසේ අයදුම්පත් ප්‍රතික්ෂේප කළ විට මොනම හේතුවක් නිසා හෝ එම අයදුම්පත් නැවත සැලකිල්ලට භාජනය කරනු නොලැබේ.

රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් සිය දෙපාර්තමේන්තු/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු වේ. අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේඛකාධිකාරී

රුහුණ විශ්වවිද්‍යාලය,
වැල්ලමඩම,
මාතර.
2018.04.23